**නාමල්ඔය ප්‍රාදේශීය සභාව - 2023**
---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති කුමක්ද යන්න පිළිබඳ සටහනක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරිපත් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති දෙකකට අදාළව ගෙවිය යුතු අතුරුදවුම් රු.602,566ක් සංවර්ධන ණයහිමි යටතේ වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි.<br>2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වරද නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ මිලදීගෙන තිබූ රු.126,900ක් වටිනා ඩිජිටල් තරාදියේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුමේ පුනරාවර්තන ආදායම් එකතු ශේෂය රු.466,203ක් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | වෙළෙඳ අයිතිය බදු දීම් (ජංගම) යටතේ රැස්කර තිබූ රු.158,550 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව සංවර්ධන ණයගැති ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය අතර රු.4,367,906ක නොසැසඳීමක් පැවතුණි. | පිළිගනිමි. 2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වරද නිවැරදි කරගැනීමට කටයුතු කරන බව. | නොගැලපීම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මෝටර් රථ හා කරත්ත | 57,746,639 | (i) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන | 2024 වර්ෂයේ දී නිවැරදි වූ ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරිපත් කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | යන්ත්‍ර හා උපකරණ | 52,464,256 | (i) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන<br>(ii) උපලේඛන | - එම - | - එම - |
| (ඇ) | ලී බඩු හා සවිකිරීම් | 5,936,036 | (i) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන<br>(ii) උපලේඛන | - එම - | - එම - |
| (ඈ) | හිඟ බලපත්‍ර ගාස්තු | 22,505 | (i) උපලේඛන<br>(ii) ශේෂ සනාථ කිරීම් | උපලේඛන සකස් කර 2024 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේ දී ඉදිරිපත් කරන බව. | ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් (EPF) පනත සහ 1980 සේවක භාරකාර අරමුදල් (ETF) පනත | දළ වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කළ යුතු වුවත්, මූලික වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව සේවක අර්ථසාධක අරමුදල් රු.37,568ක් සහ භාරකාර අරමුදල් රු.6,000ක් අඩුවෙන් ගණනය කොට අරමුදල් වෙත මුදල් යවා තිබුණි. | 2024 වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 5(12) රීතිය | මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | එක් නිලධාරියෙකු ගෙන් ඇප මුදල ලබාගෙන ඇති අතර අනෙක් නිලධාරීන්ගෙන් ඇපකර ලබා ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 59 සහ 67 රීති | සභාවේ ආදායම් පරීක්ෂකවරයා විසින් සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා වෙළෙඳ ව්‍යාපාර හා කර්මාන්ත ආයතන පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (iii) 218 රීතිය | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,095,029 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.40,005 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තු ගත ආදායම් | 2023 බිල්කළ ආදායම් | 2023 රැස්කළ ආදායම් | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තු ගත ආදායම් | 2022 බිල්කළ ආදායම් | 2022 රැස්කළ ආදායම් | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 350,000 | 754,553 | 583,018 | 585,538 | 350,000 | 161,500 | 161,500 | 414,003 |
| ii. | කුලී | 4,173,540 | 1,620,640 | 1,619,990 | 3,750 | 4,173,540 | 1,859,264 | 1,878,272 | 3,100 |
| iii. | බලපත්‍ර ගාස්තු | 837,000 | 546,550 | 546,550 | 22,505 | 837,000 | 393,945 | 393,945 | 22,505 |
| iv. | වෙනත් ආදායම් | 1,547,000 | 3,387,221 | 3,387,221 | 15,008 | 3,425,505 | 1,563,614 | 1,563,614 | 15,008 |
| | එකතුව | **6,907,540** | **6,308,964** | **6,136,779** | **626,801** | **8,786,045** | **3,978,323** | **3,997,331** | **454,616** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ දැන්වීම් පුවරු ආදායම රු.585,538ක් වූ අතර එම ගාස්තු අයකර ගැනීමට හෝ දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් නොගෙවුව හොත් දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කරන බව. | ගාස්තු අයකර ගැනීමට හෝ දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05ක් පමණක් පනවා තිබුණි. | ඉදිරියේ දී ඒ අනුව කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ දී කසල ටොන් 186ක ප්‍රමාණයක් රු.1,095,975ක වියදමක් දරා රැස්කර තිබුණු අතර දිරන කසල භාවිතා කර 2023 වර්ෂයේ කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 5441ක් නිෂ්පාදනය කර කිලෝග්‍රෑම් 4366ක් අලෙවි කිරීම තුළින් රු.87,321 ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. | 2024 වර්ෂයේදී කොම්පෝස්ට් පොහොර භාවිතය ඉහළ නැංවීමට වැඩ පිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන බව. | කොම්පෝස්ට් නිෂ්පාදනය හා අලෙවිය ඉහළ නැංවීමේ වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් මාසිකව රැස්කරන නොදිරන කසල ටොන් 21.3 ක පමණ ප්‍රමාණයක් කසල අංගනයේ විවෘතව බැහැර කර පුළුස්සා දමන බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලක් කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමට ඉදිරි වර්ෂයේ දී කටයුතු කරන බව. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් දේශීය ධාන්‍ය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන යොදා ගනිමින් සත්ත්ව ආහාර නිෂ්පාදනය හා බිත්තර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මිලදීගෙන තිබූ රු.3,388,674 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ තොගයක් මාස 08 කට අධික කාලයක් තිස්සේ භාවිතයට නොගෙන ගබඩා කර තබා ඇති බවත් මෙම භාණ්ඩ භාවිතයට නොගෙන තිබිය දී ඒවායේ වගකීම් කාලයෙන් මාස 08ක් මේ වන විටත් ඉක්මවා ගොස් තිබුණි. | LDSP PT - 02 ව්‍යාපෘතියේ අදාල මුදල් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වූ නිසා මෙම තත්වයට මුහුණ දීමට සිදු වූ බවත් මේ වන විට ප්‍රතිපාදන ලැබී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බව. | ගොඩනැගිල්ල කඩිනමින් නවීකරණය කර යන්ත්‍ර සූත්‍ර හා උපකරණ භාවිතයට ගත යුතුය. |

## 3.3 නිෂ්කාෂර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතුව පවතින අලුත්වැඩියා කළ නොහැකි වාහන 03 ක් වසර 07 සිට වසර 23 දක්වා කාලයක සිට නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර එම වාහන වෙන්දේසි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් දිරාපත් වෙමින් පැවතුණි. | එම වාහන සභාව නමින් පවරා දී නොමැති බැවින් වෙන්දේසි කළ නොහැකි බව. | වාහන පවරාගෙන වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අම්පාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මඟින් ප්‍රාදේශීය සභාව වෙත ලබා දී තිබූ ප්‍රින්ටරයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. 2024 වර්ෂයේ දී වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණ ද එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී එම වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 15 ක හා ක්‍රීඩා පිටි 07 ක වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් ටේලරයේ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | අලුත්වැඩියා කරන ලද එම ටේලරය සඳහා දරන ලද වියදම් ඇතුළත් කරමින් ගිණුම් සැකසීමට ඉදිරි වර්ෂයේ දී කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | අලුත්වැඩියා කර භාවිතා කළ හැකි තත්ත්වයේ පවතින පහත සඳහන් වාහන අයිතම 07ක් අලුත්වැඩියා කර භාවිතා කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ පරීක්ෂණ වාර්තාව ලැබුණු පසු එම වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | කඩිනමින් අලුත්වැඩියා කර භාවිතා කළ යුතුය. |
| (ඊ) | සභාව සතුව පවතින වාහන 05 ක අයිතිය සභාව නමට පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉල්ලීම්කර ඇති නමුත් මේ වන තෙක් අප වෙත පවරා දී නොමැති බව. | වාහනවල අයිතිය සභාව නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 08ක් පුරප්පාඩුව පැවතුණි. | මාසික වාර්තා මගින් මේ බව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස් කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණ ද එය සභාවේ සියලු කාර්යයන් ආවරණය වන පරිදි විධිමත්ව සිදුකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | ආයතනයේ සියලුම කටයුතු ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදුකළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | විගණන හා කළමනාකරණ කමිටු සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කර රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |